**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA** 2023.09.

13

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No . | දිනය<br>திகதி<br>Date. 2023-09-01 |

පැමිණිලි පාර්ශවය : ජේ.එම් අරුණ සම්පත් මයා,
අංක 57/3, කුඹුක්ගේයාය,
ඇතිමලේ වැව, මොණරාගල.

වින්දිත පුද්ගලයා : තරුෂ නිම්සර

වගඋත්තර පාර්ශවය :

01. ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
ඇතිමලේ.

02. උ.පො.ප - එච්.එම් චන්ද්‍රදාස මයා,
පොලිස් ස්ථානය,
ඇතිමලේ.

03. පො.සැ 61866 එන්.ජී.ජේ.සී සඳකැලුම් මයා,
පොලිස් ස්ථානය,
ඇතිමලේ.

04. පො.සැ 41827 ආර්.ජී.ජ් රාජපක්ෂ මයා,
පොලිස් ස්ථානය,
ඇතිමලේ.

05. පො.කො 69521 ඩී.එම් කරුණාසේන මයා,
පොලිස් ස්ථානය,
ඇතිමලේ.

<u>පැමිණිලි අංකය</u> : **HRC/BD/215/22**

ඉහත පැමිණිලිකරු විසින් 2022.11.22 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2022.11.17 වන දින තරුෂ නිම්සර (වයස අවු 17)

නම් තම දරුවා ඇතිමලේ, 70 හන්දිය, දරණ ස්ථානයේ පිහිටි තම ආපන ශාලාවේ සිටියදී පෙ.ව 9.30-9.45 අතර කාලයේදී ඇතිමලේ පොලිස් ස්ථානයට අනුයුක්තව සේවය කරන උ.පො.ප එච්.ඩබ් චන්ද්‍රදාස මයා, පො.සැ 61866 එන්.ජී.ජේ.සී සඳකැළුම් මයා, පො.සැ 41827 ආර්.ජී.ඒ රාජපක්ෂ මයා, පො.කො 67571 ඩී.එම් කරුණාසේන මයා යන නිලධාරීන් තම ව්‍යාපාරික ස්ථානයට පැමිණ තම පුතු වන තරුෂ නිම්සර දරුවාගේ උරහිසින් අල්ලාගෙන, තම නිවස පරීක්ෂා කිරීමට රැගෙන ගිය බවයි.

නිවස සොදිසි කරන අතරතුරදී තම දරුවාට පොලිස් නිලධාරීන් විසින් අසභ්‍ය වචනයෙන් බැනවැදුනු බවත්, නිවස සෝදිසි කරන අවස්ථාවේ නිවසේ තිබූ ඇඳුම් පවා ඡායාරූප ගත කරන ලද බවත්, එහිදී තමා විසින් තම දරුවා අත්අඩංගුවට ගැනීමට හේතුව විමසා සිටියද එයට හේතුව තමාට නොදැන්වූ බවත්, තමාගේ බිරිඳ පොලිස් නිලධාරීන්ගෙන් දැඩි ලෙස විමසූ අවස්ථාවේදී "උබේ පුතා ගැණියෙක්ගේ යට ඇඳුම් හොරකම් කරලා ඌට මානසික ලෙඩක් තියනවා" යනුවෙන් ප්‍රකාශ කරන ලද අතර, එය CCTV දර්ශනවල පවතින බවද දක්වා ඇත.

ඉන් අනතුරුව පොලිස් ජීප් රථයෙන් තම දරුවා රැගෙන පොලිස් ස්ථානය පසුකොට ක්‍රීඩා පිටිය දෙසට ධාවනය කළ බවත්, ඒ අතරතුරදී ද "උඹ ගෙදරකට ගිහින් තියනවා. උඹ වැරැද්ද පිළිගනින්, එතකොට ගෙදර යන්න දෙන්නම්" යනුවෙන් තම දරුවාට මෙම නිලධාරීන් විසින් ප්‍රකාශ කොට ඇති බවත්, තමා එසේ නොකළ බව ප්‍රකාශ කළ පසු අසභ්‍ය වචනයෙන් බැණවැදී වැරැද්ද පිළිගන්නා ලෙස තම දරුවාට බලකර ඇති බවත් දක්වා ඇත.

අදාළ දර්ශන වල සිටින්නේ තරුණ නිම්සර යන තම දරුවා නොවන බවත්, ඔහුගේ වම් පාදයෙහි "අස්ථි ගෙඩියක්" පවතින බැවින් එමගින් ඔහුව හඳුනාගැනීමේ හැකියාවක් පවතින බවත් තමා විසින් වගඋත්තරකරුවන් වෙත දන්වා සිටියද, එම නිලධාරීන් කිසිදු විමර්ශනයකින් තොරව "මේ ඉන්නේ උඹේ පුතාම තමයි. අපි පස්දෙනාගෙම ඇස් හොඳට පේනවා. අපට විශ්වාසයි මෙ ඉන්නේ උඹේම පුතා තමයි" යනුවෙන් ප්‍රකාශ කරන ලද බවත් දක්වා ඇත.

2022.11.18 දින තමාගේ දරුවා සියඹලාණ්ඩුව උසාවියට ඉදිරිපත් කළ බවත්, එහිදී ලක්ෂ 05 බැගින් ශරීර ඇප දෙකක් මත නිදහස් කළ අතර, නඩුව 2023.01.25 දිනට කල් තැබූ බවත් දක්වා ඇත. ඉන් පෙර 2022.11.19 දින ඇතිමලේ පොලිස් නිලධාරීන් විසින් මෙම CCTV දර්ශන වල සිටින්නා වූ අදාළ නිවැරදි වැරදිකරු සොයාගෙන ඇති බවත් වැඩිදුරටත් දක්වා ඇත.

ඇතිමලේ පොලිස් නිලධාරීන් විසින් පැමිණිල්ලක් ලද පමණින් කිසිදු විමර්ශනයකින් තොරවම තමාගේ දරුවා අත්අඩංගුවට ගැනීමත්, අත්අඩංගුවට ගැනීමේදී චෝදනාව තේරුම්කර නොදීමත් මෙන්ම වයස අවුරුදු 17 ක ළමයෙකු බව සලකා නොබැලීමත්, හා ඉතාමත් අසභ්‍ය නොසරුප් වචනයෙන් තමාගේ දරුවාට බැනවැදීමත්, හේතුවෙන් දරුවාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත්, තම දරුවා මානසික පීඩනයකට ලක්වූ බවත් දක්වා ඇත.

**වගඋත්තර පාර්ශවීය කරුණු දැක්වීම :-**

පැමිණිල්ලට අදාළව 2022.12.10 දිනැතිව වගඋත්තර පාර්ශවය විසින් වාර්තාවක් යොමුකර ඇති අතර එම වාර්තාවෙන් දක්වා ඇත්තේ, 2022.11.17 දින බල අපරාධ 30/2022 යටතේ වන අපරාධයකට අදාළව ජයසිංහ මුදියන්සේලාගේ තරුෂ නිම්සර යන දරුවා අත්අඩංගුවට ගැනීමට කටයුතු කරන ලද බවයි.

ඒ අනුව, 2022.11.17 වන දින පැය 11.35 ට අංක 57/03, කුඹුක්ගේයාය, ඇතීමලේ වැව යන ලිපිනයේ පිහිටි නිවසේදී තරුෂ නිම්සර දරුවා අත්අඩංගුවට ගත් බවත්, 2022.11.17 වන දින දිසානායක මුදියන්සේලාගේ ජයපද්මිණී දිසානායක යන අය විසින් "දවල් කාලයේ නිවසක් බිඳ මුදල් හා දේපළ සොරකම් කිරිමක් සම්බන්ධව කරන ලද පැමිණිල්ලට" අදාළව පැමිණිලිකාරිය විසින් තම නිවසේ සවිකර තිබූ CCTV දර්ශන පරික්ෂා කර බලා තම නිවසට පැමිණි පුද්ගලයා හඳුනාගත හැකි බවත්, ඔහු කුඹුක්යාය ඇතීමලේ පදිංචි 'පුතු' යන අයගේ පොඩි පුතා බවට හඳුනාගත් බවත්, එම අය තමාගේ නිවසට පැමිණි බවට තමා සැකකරන බවත්, ඔහුට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන ලෙස පැමිණිල්ලේ සඳහන් කර ඇති බවත් දක්වා ඇත.

ඒ අනුව අපරාධ ස්ථානයේ සවිකර තිබූ CCTV දර්ශන වල සටහන්ව ඇති පුද්ගලයාගේ වයස, ඇඳුම් හා සැකකරුගේ දේහ ප්‍රමාණය සමාන වන බැවින්, CCTV දර්ශන රජයේ රස පරීක්ෂක කාර්යාලය වෙත යොමුකර සැකකරු හා CCTV දර්ශනවල සටහන් වී ඇති පුද්ගලයා එකම පුද්ගලයෙකුද යන්න සම්බන්ධයෙන් රජයේ රස පරීක්ෂක කාර්යාලය වෙතින් පැහැදිලි කර ගැනීම සඳහා බැඳුම්කරයකට යටත් කරගැනීමට, මෙම ජයසිංහ මුදියන්සේලාගේ තරුෂ නිම්සර යන අය උප පොලිස් පරීක්ෂක එම්.ඩබ්. චන්ද්‍රදාස නිලධාරී විසින් 2022.11.18 දින GCIB පොතේ පිටුව 73 ජේද 47 යටතේ අත්අඩංගුවට ගන්නා ලද බවද දක්වා ඇත.

ඒ අනුව මෙම අපරාධයට අදාළ සැකකරු ලෙස තරුෂ නිම්සර යන අය 2022.11.18 දින අධිකරණයට ඉදිරිපත් කළ බවත්, මුල් බී වාර්තාවේද රක්ෂිත බන්ධනාගාරගත කිරීමට පොලීසිය මඟින් ඉල්ලීමක් නොකරන ලද බවත් දක්වා ඇත. අත්අඩංගුවට ගන්නා ලද්දේ දණ්ඩ නීති සංග්‍රහයේ 440, 369 වගන්ති ප්‍රකාරව වන බවත් දක්වා ඇත.

**පැමිණිල්ලට අදාළ විමර්ශන කටයුතු :-**

මෙම පැමිණිල්ලට අදාළව 2023.01.11 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පරීක්ෂණයක් සිදුකර ඇති අතර, පො.සැ 41827 ආර්.ජී.ඒ රාජපක්ෂ මහතා පොලිස් සැරයන් තනතුරට පත්වීම හේතුවෙන් පාඨමාලාවක් හැදෑරීමට සහභාගී වීම හේතුවෙන් නියමිත දින පරීක්ෂණයට පැමිණ නොසිටි අතර, පො.සැ 61866 සඳකැළුම්, උප පොලිස් පරීක්ෂක චන්ද්‍රදාස සහ පො.කො 69521 කරුණාසේන යන නිලධාරීන් කොමිෂන් සභාව හමුවේ පෙනී සිට ඇත. මෙම ගැටළුවට අදාළ

පැමිණිල්ල, පැමිණිල්ල ඉදිරිපත් කරන ලද පැමිණිලිකාරිය විසින් 2022.11.17 වන දින පෙ.ව 9.30 ට පමණ ඉදිරිපත් කර ඇති අතර, පැමිණිලිකාරිය විසින් ඇයගේ නිවසේ ඇති CCTV දර්ශන පරීක්ෂා කිරීමෙන් අනතුරුව පැමිණිල්ල සිදුකළ බවත්, පැමිණිලිකාරිය විසින්ම අදාළ CCTV දර්ශනවල සිටින්නේ තරුෂ නිම්සර යන දරුවා බව ප්‍රකාශ කළ බවත්, ඒ අනුව එම CCTV දර්ශනවල සිටින දරුවා මෙම දරුවාම නම් එහිදී ඇඳන් සිටි ඇඳුම් නිවසේ ඇත්දැයි යන්න පරීක්ෂා කිරීමට පොලිස් නිලධාරීන් සැකකරුගේ නිවසට ගිය බවත්, දක්වා ඇත.

පසුව CCTV දර්ශන තාක්ෂණ නිලධාරියෙකු කැඳවා පරීක්ෂා කරන අවස්ථාවේදී එම දර්ශන වල සිටින දරුවාට සමාන දරුවෙකු පසුව හඳුනාගත් බවත්, ගමගල, ඇතිමලේ වැව ලිපිනයේ පිහිටි එම දරුවාගේ නිවසට ගොස් ඡායාරූපය පෙන්වා විමසීමේදී එම ඡායාරූපයේ සිටින්නේ එම දරුවා එනම්, බී.එම් පසිඳු නිර්මල නැමැති දරුවා බව පිළිගත් බවත්, උ.පො.ප එම්.එම් චන්ද්‍රදාස නිලධාරී විසින් ප්‍රකාශ කර ඇත.

මෙම කාරණය සම්බන්ධයෙන් පැමිණිලි පාර්ශවය ප්‍රකාශ කර ඇත්තේ, එවැනි ඡායාරූපයක් කිසිදු අවස්ථාවක තමන් වෙත නොපෙන්වූ බවත්, අත්අඩංගුවට ගැනීමට හේතුව කිසිදු අවස්ථාවක තමාට නොදැන්වූ බවත්ය. තම දරුවාව බිය ගන්වන ලද බවත් පැමිණිලි පාර්ශවය ප්‍රකාශ කර ඇත.

නමුත් තිරුෂ නිම්සර නැමැති මෙම පැමිණිලිකරුගේ දරුවාට අදාළ ඡායාරූපය පෙන්වූ බව උ.පො.ප චන්ද්‍රදාස මහතා ප්‍රකාශ කර ඇති අතර, පැමිණිලිකාරිය විසින් CCTV දර්ශන පෙන්වා එම ඡායාරූපයේ සිටින්නේ “පුතු” නැමැති අයගේ දරුවා වන බව දිගින් දිගටම ප්‍රකාශ කරන ලද බවත්, නිරන්තර මෙම නිවසේ සොරකම් සිදුව ඇති බැවින් CCTV කැමරා පද්ධතියක් සවිකල බව ප්‍රකාශ කළ බවත් දක්වා ඇත. කෙසේ වෙතත්, වැඩිදුර විමර්ශනවලදී ගැටළුවට අදාළ නිවැරදි සැකකරු වන බස්නායක මුදියන්සේලාගේ පසිඳු නිර්මල නැමැති දරුවා සොයා ගැනීමට හැකිවූ බවත් ස්ථානාධිපති විසින් ප්‍රකාශ කරන ලද අතර, තමා වරදක් නොකලා නම් වැරැද්ද පිළිනොගන්නා ලෙස තරුෂ නිම්සර දරුවාට ප්‍රකාශ කළ බව උ.පො.ප චන්ද්‍රදාස නිලධාරියා ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. 2022.12.19 දින එම පසිඳු නිර්මල නැමැති සැකකරු අත්අඩංගුවට ගත් බවත්, මෙම ගැටළුවට අදාළ නිවැරදි සැකකරු හඳුනා ගැනීමට ඇප බැඳුම් තැබූ බවත්, සිදුවූ සොරකමට අදාළ මුදල්, සපත්තු, රන්භාණ්ඩ, දුරකථනය සොයා ගැනීමට නොහැකි වූ බවත්, උ.පො.ප චන්ද්‍රදාස මහතා ප්‍රකාශ කර ඇත.

සොරකම සිදුවූ දිනයේ සැකකරු ඇඳ සිටි ඇඳුම් පසුව මෙම සොරකමට අදාළව අත්අඩංගුවට ගත් සැකකරුගේ නිවසේ තිබී සොයාගත් බවත්, ඇඟිලි සලකුණු හා CCTV දර්ශන පරීක්ෂා කිරීමට රස පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කර ඇති බවත්, නිවැරදිභාවය ඔප්පු වුවහොත් මීලඟ උසාවි දිනයේදී තරුෂ නිම්සර දරුවා මුදා හැරීමට පියවර ගන්නා බවත් ස්ථානාධිපති විසින් ප්‍රකාශ කර ඇත.

පැමිණිල්ලෙන් දක්වා ඇත්තේ, ප්‍රසිද්ධියේ තම දරුවා අත්අඩංගුවට ගැනීමෙන් තම දරුවාට විශාල අපහාසයක් වූ බවයි. මෙම තරුෂ නිම්සර දරුවා පොලිසියට ගෙන්වා ප්‍රකාශ සටහන් කරගැනීමකින් හා නිවැරදි විමර්ශනයකින් තොරව CCTV දර්ශනවලින් ලබාගත් ඡායාරූපයක් පෙන්වමින් අවට සිටි පුද්ගලයන්ගෙන් විමසීම නිසා වින්දිත දරුවාට අපහාසයක් සිදුව ඇති බව කොමිෂන් සභා පරික්ෂණයේදීද වගඋත්තර පාර්ශවයට පෙන්වා දී ඇත. ඡායාරූප නිවැරදිව පරීක්ෂා කර බලා නිසි විමර්ශනයකින් පසුව මෙම දරුවා අත්අඩංගුවට ගැනීම සිදුකරන ලද්දේ නම් මෙම අසාධාරණය මෙම නොවන බව කොමිසම තවදුරටත් වගඋත්තර පාර්ශවයට පෙන්වා දී ඇත. කෙසේ වෙතත්, 2023.01.25 දිනැති මීලඟ නඩු වාරයේදී ඡායාරූප වල නිවැරදිභාවය උසාවියට ඉදිරිපත් කරන ලද බවත් වගඋත්තර පාර්ශවය විසින් දක්වා ඇත.

එසේම වගඋත්තර පාර්ශවීය කරුණු දැක්වීමේදී, මෙම පැමිණිලි පාර්ශවයට වූ අසාධාරණය සම්බන්ධයෙන් කණගාටු වන බව පො.සැ සදකැළුම් මහතා ප්‍රකාශ කර ඇති අතර, ඇඟිලි සලකුණු වල නිවැරදිභාවය තහවුරු වුවහොත් මෙම දරුවා මුදාහැරීමට කටයුතු කරන බවද වගඋත්තර පාර්ශවය දක්වා ඇත. තවද ඇඟිලි සලකුණු වාර්තා ලැබුනු පසු නිවැරදිභාවය ඔප්පු වුවහොත් මෝසමක් උසාවියට ඉදිරිපත් කර මෙම දරුවා නිදහස් කරන බව වගඋත්තර පාර්ශවය සඳහන් කරන අතර, ඇඟිලි සලකුණු වාර්තාව ලැබුනු පසු අදාළ වාර්තාව යොමු කරන ලෙස තවදුරටත් වගඋත්තර පාර්ශවයට කොමිෂන් සභාව විසින් දන්වා ඇත.

2023.03.19 දැනැතිව පැමිණිලි පාර්ශවය විසින් යොමු කර ඇති ලිපියේ සඳහන් වී ඇති පරිදි ඉහත අගතියට පත් තමාගේ දරුවා වන ජේ.එම් තරුෂ නිම්සර දරුවා සියඹලාණ්ඩුව ගරු අධිකරණයේ පැවැති 443/22 නඩු අංකය යටතේ නඩුව පැවැති අවස්ථාවේදී, ඇතිමලේ පොලිස් ස්ථානයට නව ස්ථානාධිපති වශයෙන් පැමිණි ප්‍ර.පො.ප අබේසිංහ නිලධාරියා විසින් අධිකරණයට මෝසමක් මඟින් කරුණු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව නඩු දිනට ප්‍රථම දරුවා නිදහස් කිරිමට කටයුතු කරන ලද බවද දක්වා ඇත.

**නිරීක්ෂණ :-**

වගඋත්තර පාර්ශවයට පැමිණිල්ල ලද විගසම හා CCTV දර්ශන අනුව මෙම දර්ශණ වල සිටින්නේ (තරුෂ නිම්සර) "පුතු" නැමැති අයගේ දරුවා යැයි විරුද්ධ පාර්ශවය ප්‍රකාශ කළ පසු මෙම CCTV දර්ශන තාක්ෂණ නිලධාරියෙකු ලවා පරීක්ෂා නොකර මෙම දරුවා අත්අඩංගුවට ගෙන ඇති බවත්,

පැමිණිලි පාර්ශවීය නිවසට ගොස් එම CCTV දර්ශනයේ ඇති ඇඳුමට සමාන ඇඳුම් සෙවීමට මෙම දරුවාගේ ඇඳුම් ඡායාරූපගතකර ඇති බවත්,

පොලීසියට පැමිණිලි කළ කාන්තාවගේ යටඇඳුම් සොරාගත් බව පැමිණිල්ලේ සඳහන් කර තිබීම සහ පොලීසිය විසින් නිවස පරික්ෂා කිරීමේදී මෙම යට ඇඳුම්ද නිවස තුළ සොයා බලා ඇති බවත් නිරීක්ෂණය වේ.

මෙම වින්දිත දරුවා අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2022.11.19 දින CCTV දර්ශන අනුව එම ඡායාරූපයේ සිටි නිසි සැකකරු වන පසිඳු නිර්මල යන අය අත්අඩංගුවට ගෙන 2020.11.20 දින අධිකරණයට ඉදිරිපත් කර ඇත. එමෙන්ම මෙම පසිඳු නිර්මල නැමැති සැකකරු තමා මෙම සොරකම කළ බවට හා සොරකම් කළ භාණ්ඩ ඇති ස්ථාන පොලීසියට පෙන්වා ඇති අතර, එම භාණ්ඩ පොලීසිය විසින් සොයාගෙන ඇත.

ඒ අනුව නිසි විමර්ශනයකින් තොරව ඇතිමලේ පොලිස් නිලධාරීන් විසින් අත්අඩංගුවට ගැනීම නිසා මෙම පැමිණිලිකරුගේ දරුවා මහත් අපහසුතාවයන්ට පත්ව ඇති බවත්, මෙම තත්වය හේතුවෙන් දරුවා 2021 වසරේ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ ප්‍රතිඵල ලැබීමෙන් අනතුරුව උසස් පෙළ හැදෑරීම අතහැර ඇති බවත් නිරීක්ෂණය වේ.

2023.01.11 දින මෙම කොමිෂන් සභාවේ පැවැති පරික්ෂණයේදී ඇඟිලි සලකුණු වාර්තාව ලැබීමෙන් පසු එම වාර්තාවෙන් මෙම තරුණ නිර්මසර දරුවා නිවරදිකරුවෙකු බව අනාවරණය වුවහොත් අධිකරණය වෙත මෝසමක් ඉදිරිපත් කර දරුවා නිදහස් කරන බව ඇතිමලේ පොලිස් ස්ථානාධිපති විසින් ප්‍රකාශ කර ඇති අතර, එම ඇඟිලි සලකුණු වාර්තාව ලැබුනු පසු මෙම කොමිෂන් සභාව වෙත අදාළ වාර්තාව ඉදිරිපත් කරන ලෙසට දන්වා ඇතත්, එම වාර්තාව ලබා දී නොමැත.

**නිගමනය :-**

මෙම කරුණු අනුව පොලීසිය විසින් තරුණ නිර්මසර වන මෙම දරුවා අත්අඩංගුවට ගැනීමේදී 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 13 වන ව්‍යවස්ථාවේ සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් පරිදි නිර්දේශ කරමු.**

01. අදාළ 2-5 දක්වා වූ වගඋත්තරකරුවන් විසින් රු. 50,000/- ක මුදලක් වින්දිත දරුවාට ගෙවිය යුතුය.

02. මෙම නිලධාරීන් සම්බන්ධව සුදුසු පියවර ගැනීම සඳහා පොලිස්පතිවරයා වෙත මෙම නිර්දේශයේ පිටපත් යොමු කරනු ලැබේ.

2023.0෧. 04 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :-

01. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

02. මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රාදේශීය කාර්යාලය,
බදුල්ල.

B/